ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

*Phone* : 020 74289388
*Fax* : 0871 9005163
E-mail : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

## ලංකාවිත්ති ලිපිනය වෙනස්වූ බව කරුණාවෙන් සලකන්න. මේ නව ලිපිනයයි.

## අලි අපරාධයක් !

**මෙ**ම පිටුවේ සිටින ඇත් පැටවා දෙස බලන්න. තවම කිරි බොන වයසේ සිටින මේ පැටියාට වයස අවුරුදු 3 කි. මවකගේ ආදරය තුළ වැඩෙන මේ දරුවා කාගේ වුවද හිතට දරු සෙනෙහස ඇතුල් කරවයි. මෙවැනි පැටියෙකු මවගෙන් වෙන් කළ හැකිද? එසේ වුවහොත් මවගේ හද පැළී මියෙනවා ඇත. පැටියා මව් නැති ශෝකයෙන් විශාල වේදනාවක් ලබනවා ඇත. ඒ නිසා කිරිබොන වයසේ දරුවෙකු මිනිස් හෝ තිරිසන් හෝ වෙනයම් යෝනියක හෝ මොන හේතුවක් නිසා හෝ මවගෙන් වෙන් නොකෙරේ. එය දියුණු හෝ නොදියුණු කිසිම රටක සිදු නොකරන දෙයකි. එසේ කළහොත් එය මහා අපරාධයක්, අධම, නිහීන, තිරිසන් ක්‍රියාවක් ලෙස ශීලාචාර ලෝකය තීන්දු කරනවා ඇත. එය එසේ විය යුතු ය.

එහෙත් මා මේ අවධාරණය කළ දෙය සති දෙකකට පෙර අපේ රටේ සිදුවිය. බුදුන් තෙවරක් වැඩිය, එසේම පිරිසිදු බුද්ධාගම තිබෙන බව ආඩම්බරයෙන් කියන, බුදුහාමුදුරුවන්ගේ දන්ත ධාතුව සුරැකෙන අපේ ශ්‍රී ලංකාවේ සිදුවිය. මෙහි ඇති වඩාත්ම ඛේදජනක සහ ලැජ්ජා සහගත දෙයනම් ඇත් පැටවුන් දෙදෙන පැහැරගෙන ගිය ආකාරය සහ ඊට සම්බන්ධවූ පිරිසයි. දළදා මාළිගාවේ දියවඩන නිළමේ වන නිලංග දැල බණ්ඩාර මෙම අමානුෂික මෙහෙයුමේ නියමුවාය. සංචාරක ඇමතිවරයාද මෙහි කොටස්කරුවෙකි. පින්නවල අලිගාල ඔහුගේ අමාත්‍යංශය යටතේ නිසාය. තව හෙංචයියලා මෙහි සිටින්නට පුළුවන. දියවඩන නිළමේ ඇත්පැටව් දෙන්නා ගේන්නට ගියේ පාතාලයේ ගණන්කාරයින් බැංකුවක් මංකොල්ල කන්නට යන ආකාරයට ය. ආයුධ සන්නද්ධ භට පිරිසක් ද සමගය. අලි පැටියෙක් අරන් එන්න තුවක්කු ගිනිඅවි මොකටද?

ඇත් පැටව් දෙන්නාට පහරදී ඇති බවට සාක්ෂි ඇත. එක් මිනිසෙක් ලොකු පොල්ලක් අතේ ඇතිව ඇත් පැටියෙකු දෙසට යන පින්තූරයක් පත්‍රයේ පළවිය. පැටවෙකුගේ තවමත් මෝදුවීගෙන එන කුඩා දළයක්ද කැඩී ඇති බව දුටු අය කියති. මව ළඟ නැති නිසා පැටව් අකීකරුවූ බව පැටව් හිරකරගෙන සිටි මාලිගාවේ අයගේ වචනය. අම්මා ළඟ නැතිවිට ඒ අහිංසක පැටව් වෙන මොනවා කරන්නද? මේවා අධම ජඩ ක්‍රියා මිස පැහැදීමෙන් කතාකළ හැකි දේ නම් නොවේ.

අලියා ඇතා උතුම් සත්ව ගනයට වැටේ. බෞද්ධ කතාවන්හි ඇතා හඳුන්වන්නේ හස්ති රාජයා යනුවෙනි. සිදුහත්කුමරු කුස පිළිසිඳෙන දා රැයේ මහමායා දේවිය දුටු සිහිනයේ වූයේ නෙළුම් මලක් හොඬෙන් ගත් සුදු ඇත් පැටවෙකි. පාරිලෙය්‍යය වනයේ දී බුදුහාමුදුරුවන්ට ඇතෙක් උපස්ථාන කළේය. බුදුහාමුදුරුවන්ගේ දළදාව බාරගෙන සිටින පිරිසට නම් අලියා යනු දම්වැල් වලින් කකුල් බැඳ කිතුල් කොට කෑල්ලක් කන්නට දී පෙරහැරේ දක්කාගෙන යන සිව්පාවෙක් පමණි. මිහිඳු හාමුදුරුවන් අද වැනි දවසක වැඩසිටියේ නම් ලංකාව වැනි අමනුස්සයින් බහුල රටකට උතුම් බුදු දහම හඳුන්වාදීම ගැන ශෝකවෙනවා නොඅනුමාන ය.



One of the cubs with its mother before being taken away

## Two elephant cubs seperated from their mothers & took away by Kandy Diyawadana Nilame

Two tusked elephant cubs which were not even three years old have been taken away by force from the Elephant Orphanage at Pinnawela by Nilanga Dela Bandara - the Diyawadana Nilame of the Temple of the Tooth in Kandy. About 50 personnel of the STF and Army had gone to the orphanage on Saturday 25th at about 7.00 p.m., forced the officials of the orphanage to anaesthetise the mother elephant and the two cubs and taken away the cubs.

According to veterinarians an elephant cub is suckled for at least five years and during this period the cub should essentially be with its mother. Due to this reason elephant cubs are never removed from the orphanage until they complete five years and this has been laid down in a court order as well. Also, cabinet approval has to be obtained when tamed elephants from Pinnawela are made available to the procession of the Temple of the Tooth. Even then approval is given for elephants which are five years old or more.

Diyawadana Nilame had requested for two tamed elephants to be used in Perehera. When officials at Pinnawela showed him two suitable ones, Nilame rejected them and insisted taking two tusked sucklings. The authorities in the orphanage opposed his attempt to take the cubs. So the following evening as mentioned above Diyawadana Nilame came again with armed men and took away what he wanted.

The reports said that later in Kandy, the two elephant calves had been shackled and kept in a small garage. They had being tortured as they were behaving violently as they missed their mothers. It is reported that the two calves have been burnt with heated iron bars. The Young Animal Lovers Society has issued several photographs to the media showing a person carrying a pole to hit the calves. Environmentalists and animal lovers say no action has been taken to stop the dastardly act as the removal of the calves had been done with the knowledge of the Maha Nayaka Theros of Malwatta & Asgiriya, tourism minister Gamini Lokuge and the President

## දියවඩන නිළමේ කිරිබොන වයසේ ඇත් පැටව් දෙදෙනෙකු පැහැරගෙන යයි

**පි**න්නවල අලි අනාථාගාරයේ සිටි වයස අවුරුදු තුනේ, තවමත් කිරිබොන ඇත් පැටවුන් දෙදෙනෙකු නුවර පෙරහැරට පුරුදු කිරීමටය කියා බලෙන් පැහැරගෙන යාමේ පුවතක් ගැන ලංකාවාසීහු ඉමහත් ශෝකයට සහ කළකිරීමට පත්ව සිටිති. මෙයට මූලිකවී ඇත්තේ දළදා මාළිගාවේ දියවඩන නිළමේ වන නිලංග දැල බණ්ඩාර ය.

නුවර පෙරහැරේ ගෙනයාම සඳහා මාළිගාව පින්නවල අලි අනාථාගාරයෙන් අලි පැටවුන් දෙදෙනෙකු ඉල්ලා ඇත. එය රජයෙන් අනුමත කළාය. දැල බණ්ඩාර උන් ගෙනයාමට පැමිණියේය. එතැන්හිදී ඔහු තවත් ඇත් පැටවුන් දෙදෙනෙකු දැක උන් ඉල්ලාඇත. තවම කිරි බොන වයසේ නිසාත්, අනාථාගාරයටම සිටින එකම ඇත් පැටවුන් උන් නිසාත් ඉල්ලීම ප්‍රතික්ෂේප විය. පසුදා හවස දැල බණ්ඩාර ආයුධ ගත් හමුදා සහ පොලිස්භට පිරිසක් සමග විත් ඇතින්නන්ට හා පැටවුන්ට සිහිනැති කරන ලෙස අනාථාගාර සේවකයන්ට අණකොට ඇත් පැටව් දෙදෙන පැහැරගෙන ගියේය. සංචාරක ඇමති ගාමිණී ලොකුගේද පැමිණ මෙයට සහාය වී ඇත. අනාථාගාරයේ සේවකයන්ද සංචාරකයන්ද ගම්වැසියන්ද ඊට විරෝධය පැවත් වැඩක් වුණේ නැත. සත්ව අහිංසක සමිති සාමාජිකයන් පසුපස හඹා ගොස් විපරම් කළවිට දුටුවේ ඇත්පැටව් දෙදෙන මව නැති දුකෙන් තරමක් අකීකරුව හැසිරුණු විට උන් මෙල්ල කරන්නට පොලු වලින් පහර දී, යකඩයක් රත්කර ඇඟ පුලුස්සා ඇති බව යි. මල්වතු හා අස්ගිරි මහනාහිමිවරු කියන්නේ දියවඩන නිළමේතුමා කළේ නරක වැඩක් නොව ඉතා ප්‍රයෝජනවත් වැඩක් බවයි.

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතොපදේශයෙන්

අයං නිජ: පරොවෙති - ගනනා ලඝු චෙතසාම්
උදාර චරිතානාං තු - වසුධෛව කුටුම්බකම්

***අර්ථය*** : *මෙය මගේ, මෙය මගේ නොවේ අන් අයගේයි, මෙයා මගේයි, මෙයා අන් අයගේයි, සැලකීම කෙලෙස් හරිත පුහුදුන් අදහස් ඇත්තන්ගේ කල්පනාවකි. උදාර චරිත ඇත්තෝ වනාහි මුළු පෘථුවියම සිය නිවස මෙන් සලකති.*

**මෙ**ම පද්‍යයෙන් විස්තර කිරීමට උත්සාහ ගෙන ඇත්තේ සාමාන්‍ය ගති සිරිත් ඇත්තන්ගෙන් උදාර පුද්ගලයින් වෙන්කර හඳුනාගන්නා ක්‍රමයයි. ලෞකික ආශාවන්ට අසීමිත ලෙස ගොදුරු වුණු සාමාන්‍ය පුද්ගලයෙකුගේ ප්‍රධානතම ලක්ෂණය වන්නේ මේ දේවල් ද, මේ අය ද, මගේ ය, මේදේවල් හා මේඅය අනුන්ගේ ය වශයෙන් කොටස් කිරීම හෙවත් බෙදා වෙන් කිරීමයි. මේ සඳහා අප ජීවත් වන සමාජයෙන් සොයාගත හැකි නිදසුන් සිය ගණනකි.

තමන්ගෙන් පටන් ගන්නා ආත්මාර්ථකාමීබව මුළු ලෝකය දක්වාම පැතිර පවතී. මගේ ගේදොර, මගේ බඩුමුට්ටු, මගේ ඉඩකඩම් ආදී වශයෙන් පළමුව තමා වටා පවුරක් බැඳ ගනී. ඉන් පසුව තම අඹුව, තම දරුවන්, තම දෙමාපියන් ආදී වශයෙන් ඉන් ඔබ්බට ගිය තවත් වැටක් බැඳ ගනී. ඉන් නොනැවතී තම ඥාතීන් හිත මිතුරන්, ගුරුදෙගුරුන් යනාදී ආකා රයට තමා වටා තිබූ පවුරු පදනම් තවත් පුළුල් කර ගනී. තම පළාත, රට, ජාතිය, ආගම, මහාද්වීපය වශයෙන් ද වළලු තනා අවසාන වශයෙන් අපේ ලෝකය යනුවෙන් මුලින් තමා වටා බැඳගත් පවුර අවස්ථානු කූලව ඒ ඒ තන්හිදී පුලුල් කර ගැනීමේ හැකියාව සාමාන්‍ය මිනිසා තුළ පවතී.

මෙම සංකල්පය නිසාම මිනිසුන් භේදභින්නවීම නොවැළැක්විය හැක්කකි. මෙහි ප්‍රතිඵලය ඉතාම අවාසනාවන්ත වූවකි. ලොව බොහෝ අවුල් වියවුල්, යුද්ධ කෝලහල වලට මූලික හේතුව හා වස්තු බීජය වන්නේ ද මෙම පටු ආකල්පයයි.

මිනිසුන් කුල වශයෙන් බෙදී, අනුන් හා නොපෑහී, කුලය උසස්ම සුදුසුකම සේ සිතමින්, අන් අය හෙළා දකිමින් කටයුතු කරනු දක්නා ලැබේ. ආගම් වශයෙන් භේද භින්නව ආගම් යුද්ධ දක්වා එය දුර දිග ගෙනයති. ජාති වශයෙන් බෙදී දේශ සීමාව සඳහා සටන් කරති. තම රට පුළුල් කරගැන්මට, තවත් රටක් ආක්‍රමණය කරමින් යුද්ධ කරති. මෙසේ මිනිසා තමා යන පටු ආත්මාර්ථය තුළට වැදී ලොවට විශාල විනාශයන් සිදු කරන බව පැහැදිලිය.

බුදුරජාණන් වහන්සේ ප්‍රධාන කොට ඇති ආගම් කතුවරුන් මෙන්ම ඉන් මෙහා සිටි බොහෝ උදාර චරිත ගැන අපි අසා ඇත්තෙමු. ඒ උතුමෝ ආත්මාර්ථකාමී බවින් තොර වූවෝ වෙති. උදාර පුද්ගලයින් සේවය කරන්නේ තමන් සඳහාම පමණක් නොවේ. ඔවුන්ගේ පරමාර්ථය සියල්ලන්ටම සේවයක්, සෙතක් සැලසීමයි, එය මනුෂ්‍ය වර්ගයාට සීමාවූවක් ද නොවේ. තමන්ගෙන් පටන්ගන්නා සේවය තම නෑ හිතමිතුරන්, ගම, රට, ජාතිය ආදී වශයෙන් පුළුල් කරමින් මිනිස් සංහතියටත්, ඉන් නතර නොවී සත්ව ප්‍රජාවටත්, අජීවී හැම වස්තුවකටත් යහපත උදා කරයි.

ඉහත පද්‍යයේ සඳහන් ආකාරයට තමාගේයයි කිසිවක් වෙන් නොකොට මුළු පෘථුවිය මුළු ලොව තමන්ගේ නිවස මෙන් සලකා කටයුතු කිරීමේ හැකි යාව ඇතිතේ එබඳු උදාර චරිත ඇති උතුම් පුද්ගලයින්ට පමණකි.



*රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති*
♦ *පූජ්‍ය විල්ඹයේ විමලජෝති හිමි*
ලන්ඩන් බෞද්ධ විහාරය
London Buddhist Viharaya
The Avenue, London W4 1UD

ANOOMA & HEGODA
Solicitors

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772

Colombo Office
Visa Refusals
Property Purchase in Sri Lanka
Hegoda & Hegoda
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632